| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.16 පැය 1725 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/74/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**වෙඩි තැබීමකින් පුද්ගලයින් දෙදෙනෙකු මියයාම - මන්නාරම පොලිස් වසම.**

2025.01.16 වන අද දින උදෑසන කාලයේ මන්නාරම පොලිස් වසමේ මන්නාරම ගරු මහේස්ත්‍රාත් අධිකරණ ආසන්නයේදී යතුරු පැදියකින් පැමිණි නාඳුනන පුද්ගලයින් දෙදෙනෙකු විසින් සිදු කළ වෙඩි තැබීමකින් කාන්තාවක් ඇතුළු පුද්ගලයින් සිව්දෙනෙකු තුවාල ලබා මන්නාරම රෝහලට ඇතුලත් කිරීමෙන් පසු දෙදෙනෙකු මියගොස් ඇත. එක් තුවාලකරුවෙකු වැඩිදුර ප්‍රතිකාර සඳහා යාපනය රෝහල වෙත මාරුකර යවා ඇත.

**මරණකරුවන් වයස අවුරුදු 42ක් හා 60 ක් වන උයිලංකුලම ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මොවුන් ගරු අධිකරණයේ නඩු කටයුත්තක් සඳහා පැමිණ සිටියදී මෙම වෙඩි තැබීමට ලක්ව ඇති බවත්, වෙඩි තැබීම සඳහා පිස්තෝල අවියක් භාවිතා කර ඇති බවටත් දැනට සිදු කරන ලද විමශර්නයේදි අනාවරණය වී ඇත.

2022.06.04 වන දින පැවති තිරික්කල් තරඟයකදී දෙපාශර්වයක් අතර ඇති වූ ආරවුලක් මත 2022.06.10 වන දින උයිලංකුලම පොලිස් වසමේ නොච්චිකුලම ප්‍රදේශයේදී තියුණු ආයුධ වලින් කපා ද්විත්ව මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීම සහ තවත් පුද්ගලයින් දෙදෙනෙකුට බරපතල තුවාල සිදුකිරීමේ අපරාධයේ ඉහත මරණකරුවන් දෙදෙනා සහ තුවාලකරු සැකකරුවන් වන අතර තුවාලකාරිය වෙනත් නඩුවක් සඳහා අධිකරණය වෙත පැමිණි කාන්තාවකි.

එම අපරාධයට අදාළව සැකකරුවන් 20 දෙනෙකු පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇති අතර ඒ සම්බන්ධයෙන් මන්නාරම ගරු අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතියි. මියගිය වයස අවුරුදු 42 ක් වූ පුද්ගලයා එම අපරාධයේ පළමු සැකකරු වන අතර ඔහු මන්නාරම ගරු මහ අධිකරණයේ ඇප ලබා සිටි අයෙකු වේ. 2024.02.19 වන දින උයිලංකුලම,නොච්චිකුලම කනත්ත අසලදී යතුරුපැදියකින් පැමිණි නාඳුනන තුවක්කුකරුවන් දෙදෙනෙකු විසින් මෙම මියගිය වයස අවුරුදු 42ක් වූ පුද්ගලයාට වෙඩි තැබීමක් සිදු කර ඇති අතර එම අවස්ථාවේදී ඔහුට තුවාල කිසිවක් සිදුවී නොමැත.

2023.07.04 වන දින උයිලංකුලම් පොලිස් වසමේදී කැබ් රථයක රියදුරු විසින් යතුරුපැදියක් රිය අනතුරකට ලක් කර යතුරුපැදි කරු ජීවිතක්ෂයට පත් කර ඇත. එම මියගිය යතුරුපැදිකරුද ඉහත වෙඩි තැබීම හේතුවෙන් මිය ගිය වයස අවුරුදු 42ක් වූ පුද්ගලයාගේ ඥාතියෙකු බවට අනාවරණය වී ඇත. මෙම අනතුර සිදු කළ කැබ් රථයේ රියදුරු සහ කැබ් රථයේ හිමිකරු අත්අඩංගුවට ගෙන ගරු අධිකරණයට ඉදිරිපත් කර ඇති අතර එම අපරාධයට ආධාර අනුබල දුන් සැකකරුවෙකු විදෙස්ගතව ඇති බැවින් එම සැකකරුට ජාත්‍යන්තර නිල් නිවේදන නිකුත් කර ඇත.

2023.08.24 වන දින අඩම්පන් පොලිස් වසමේදී යතුරුපැදියකින් ගමන් කරමින් සිටි පුද්ගලයින් දෙදෙනෙකුට නාඳුනන තුවක්කරුවකු විසින් වෙඩි තබා ඝාතන කර ඇති අතර එම සිද්ධියේ මියගිය පසුපැදිකරු 2022.06.10 වන දින නොච්චිකුලම ප්‍රදේශයේ ද්විත්ව

මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීම සහ තවත් පුද්ගලයින් දෙදෙනෙකුට බරපතල තුවාල සිදුකිරීමේ අපරාධයේ සැකකරුවෙකු වේ.

දෙපාශර්වයක් අතර කලක සිට පැවති ආරවුලක් මත මෙම ඝාතන සිදුව ඇති අතර මන්නාරම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**